ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/26/09/24

## මාධ්‍ය නිවේදනය

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍ර නිකුත් වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍රය නිකුත් වීම සම්බන්ධයෙන් ලැබූ පැමිණිල්ලක් අනුව 2024 සැප්තැම්බර් 26 වැනි දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විමශර්නයක් පැවැත්විය. මෙය මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් එන්. ජී. පුංචිහේවා මහතාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් විභාග දෙපාතර්මේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් යන අය වගඋත්තරකරුවන් ලෙස ද, පැමිණිලිකරුවන් වන  දෙමාපියන් සහ නීතීඥවරයෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විය.

සිසුන්ගේ මානසික යහපැවැත්මට සහ අනාගත අපේක්ෂාවන්ට ඇති වන බලපෑම් සැලකිල්ලට ගනිමින් මෙම ගැටලුව කඩිනමින් විසඳීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් ඵලදායී විසඳුමක් ලබා දීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරයා උපදෙස් ලබා දුන්නේය. තවද විභාග

දෙපාර් තමේන්තුවේ පවත්වන අභ්‍යන්තර විමශර්නයේ ප්‍රගතිය පිළිබඳ වාර් තාවක් සතියක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස විභාග දෙපාර් තමේන්තුවට දැනුම් දෙන ලදී. තවද මානව හිමිකම් කොමිෂන් සභාවට සහ විභාග දෙපාර් තමේන්තුවට අදාල ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස පැමිණිලි පාර් ශවයන් දන්වා සිටින ලදී.

මීට අමතරව ඉදිරි සතිය ආරම්භයේදී අපරාධ පරීක්ෂණ දෙපාර් තමේන්තුව කැඳවමින් පරීක්ෂණයක් පැවැත්වීමට මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කරන ලදී.

නිහාල් චන්ද්‍රසිරි
මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර් යේෂණ හා අධීක්ෂණ අංශය.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

26.09.2024

දුරකථන අංකය : 011 2505595
විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com